Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පාඩම 1 - අපේ පාසල**

## අපේ පාසලේ ඉතිහාසය

- පාසලේ ඉතිහාසය යනුවෙන් අදහස් වන්නේ පාසල ආරම්භවූ දා සිට මේ දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳ තොරතුරු ය.

### ප්‍රදේශයේ පාසලක් ආරම්භ කිරීමට මුල් වූ හේතු -

- ජනගහන වර්ධනය
- ආසන්නයේ පාසලක් නොමැති වීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති.
- සමාජ ප්‍රතිපත්ති ආදී හේතු බලපායි.

### පාසල් ආරම්භ වූ ආකාර

- රජයේ පාසලක් ලෙස
- රාජ්‍ය ප්‍රතිපත්ති මත
- ප්‍රභූවරයෙකුගේ / දානපතියෙකුගේ පරිත්‍යාගයක් ලෙස
- ආගමික ස්ථානයක් ලෙස
- ආගමික ස්ථාන මුල් කරගෙන ආදී වශයෙන් බිහිවී ඇත.

---

## පැවරුම

1. ඔබගේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරී වන මූලාශ්‍ර පහක් ලියන්න.
2. ඔබ පාසලේ වර්ධනයේ වැදගත් අවස්ථාවන් සිදු වූවා නම් එම වර්ෂ සඳහන් කරන්න.
   උදා -
   - කණිෂ්ට විද්‍යාලයක් බවට පත්වීම
   - මහා විද්‍යාලයක් බවට පත්වීම
   - මධ්‍ය මහා විද්‍යාලයක් බවට පත්වීම
3. ඔබේ පාසලේ කීර්තිමත් ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගේ නම් ලියා ඔවුන් කීර්තියක් උසුලන ක්ෂේත්‍ර සඳහන් කරන්න.
4. ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කරන්න.
5. 6 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය පෙළ පොතේ ක්‍රියාකාරකම 1 හි සඳහන් 1 හා 2 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

---